# අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සම්බන්ධය පිළිබඳ විමසීමක්

මඩුගල්ලේ සුදත්ත හිමි

## ප්‍රවේශය

දර්ශනය විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් පැතිකඩක විසිරෙන විෂයකි. සඳ හා හිරු මහා පෘථිවිය ආලෝකවත් කරන්නා සේ දර්ශන විෂය ද සියලු ක්ෂේත්‍රවලට සම්බන්ධ වෙමින් ඒවායේ ආරම්භයට, පැවැත්මට හා සංවර්ධනයට විශාල මෙහෙවරක් සිදු කරනු ලැබේ. ඒ අනුව දර්ශනය සියලු කලාවන්ගේ හා විද්‍යාවන්ගේ ආරම්භය බව පැහැදිලි වේ.

එනයින් දර්ශනය අධ්‍යාපනයට ද එක හෙළාම සම්බන්ධ වේ. පුද්ගලයා තුළ පැවති සහජ ශක්තීන් ක්‍රමානුකූලව වර්ධනය කිරීම හා සදාචාරවත් හික්මීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප ලබා දීම අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යභාරයයි. එම කාර්යභාරය සඳහා ප්‍රධාන මග පෙන්වීම සිදු කරනුයේ දර්ශනය තුළිනි. දර්ශනයක් නොතිබෙන්නට වර්තමාන සමාජය ද ඉතා කෲර වනමෘගයන් හා සමාන වූවන් වීම නොවැළැක්විය හැක්කකි. ඒ අනුව මානව වර්ගයාගේ සියලු අංශවල සංවර්ධනය සඳහා මූලික මග පෙන්වීම දර්ශනය තුළින් සිදු වේ. එලෙසින් අධ්‍යාපනයට දර්ශනයක් අනිවාර්ය වන අතර එයින් තොර වුවහොත් නිවැරදි අධ්‍යාපනයක් පවතීද යන්නත් ප්‍රශ්නයකි. ඒ අයුරින් දර්ශනය අධ්‍යාපනයට සම්බන්ධ වන ආකාරය පිළිබඳ විමසීමක් සිදු කිරීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වේ.

## අධ්‍යාපනය නිර්වචනය කිරීම

අධ්‍යාපනය යන වචනය සාමාන්‍ය ව්‍යවහාරයේ දී භාවිත වන්නේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ලෙසය. නමුත් ඉන් ඔබ්බට ගැඹුරු අර්ථයක් ගැබ් වන බව අධ්‍යාපනඥයින්, දාර්ශනිකයින්, සමාජ විද්‍යාඥයින්, මනෝ විද්‍යාඥයින් ආදි ඒ ඒ ක්ෂේත්‍රවල සිටින විද්‍යාඥයින්

ස්ව විෂයානුබද්ධව ඉදිරිපත් කර ඇති අර්ථ විග්‍රහ විමසීමේ දී පැහැදිලි වේ. ඒ අනුව අධ්‍යාපනය යන්න සඳහා එක් නිවැරදි නිර්වචනයක් ඉදිරිපත් කිරරීම අසීරුය.

අධ්‍යාපනය යන වචනය සංස්කෘත භාෂාවෙන් සිංහලයට පැමිණි වචනයකි. එය සැකසෙනුයේ 'අධි + ආපන' යන පද එකතු විමෙනි. එහි 'අධි' යන උපසර්ගයෙන් උසස් යන්නත්, 'ආපන' යන පදයෙන් පැවැත්ම යන්නත් අර්ථවත් වන අතර ඒ අනුව සිංහල භාෂාවේ යෙදෙන අධ්‍යාපන යන්නෙහි පදගතාර්ථය ලෙස 'උසස් පැවැත්ම' යනාර්ථය ලබා දිය හැකිය (අලුත්වල, 1993ඃ පිටුව 05).

පාලි භාෂාවෙන් අධ්‍යාපනය යන්න සඳහා 'අජ්ඣාපන' යනුවෙන් භාවිත වන අතර එහි අර්ථය පාලි ඉංග්‍රීසි ශබ්දකෝෂයේ දැක්වෙනුයේ 'ඉගැන්වීම, උපදෙස්දීම' යනුවෙනි (Willians 1960: පිටුව 22). ඒ අනුව ඉතා උසස් පැවැත්ම සඳහා ඉගැන්වීම, උපදෙස්දීම ආදි ලෙසින් පාලි හා සංස්කෘත භාෂාවලින් අර්ථ විග්‍රහ වන බව පැහැදිලි කළ හැකිය.

අධ්‍යාපනය යන වචනය ඉංග්‍රීසි භාෂාවේ දී 'Education' යනුවෙන් දක්වන අතර එම පදයේ නිෂ්පත්තිය ලතින් භාෂාවෙන් සිදු වූ බව අගාර්වල් විසින් දක්වා ඇත. එහි නිරුක්තිය ඔහු ඉදිරිපත් කරනුයේ පහත ආකාරයෙනි.

Education - ඉගැන්වීමේ ක්‍රියාවලිය,

Educere - මඟ පෙන්වීම හෝ එළියට ගැනීම,

Educare - ඇති දැඩි කිරීම, පුහුණු කිරීම,

Educo - ඉදිරියට යොමු කිරීම, සාරය එළියට ගැනීම (Aggarwal, 1995ඃ page 11).

යනුවෙන් පද විග්‍රහ වන අතර එහි අර්ථය සිල්වි සේනාධීර උක්තාකාරයෙන් දක්වයි (සේනාධීර හා වනසිංහ, 2006ඃ පිටුව 5). ඒ අනුව අධ්‍යාපනය යනු ඉගැන්වීම, මඟ පෙන්වීම, පුහුණු කිරීම සම්බන්ධ ක්‍රියාවලීන් රැසක එකතුවක් බව පැහැදිලි වේ.

පදගතාර්ථයට අමතරව අධ්‍යාපනය පිළිබඳ දාර්ශනික නිර්වචන ඇසුරින් ද අධ්‍යාපනය යන්න සඳහා අර්ථකථන ලබා දිය හැකිය.

''අධ්‍යාපනය යනු අපේක්ෂිත දිශාවන් කෙරේ ශිෂ්‍ය චර්යාවන් හෙවත් හැසිරීම් වෙනස් කිරීමේ ක්‍රියාවලියයි'' (එච්.එම්. චන්ද්‍රසේකර, 2018: පිටුව 10).

යනුවෙන් දැක්වෙන පරිදි ශිෂ්‍යයාගේ විභව ශක්තීන් හඳුනා ගෙන ඒවා දියුණු කිරීම සඳහා සිදු කරන උපදේශන, තොරතුරු සැපයීම, මග පෙන්වීම් ආදි වූ ක්‍රියාවලීන් ඇතුලු සමස්ථය අධ්‍යාපනය නම් වේ. එලෙසම Eric Hoffer අධ්‍යාපන ක්‍රියාවලිය හා එහි ඵලය පිළිබඳ අවධානය යොමු කරමින් අධ්‍යාපනය නිර්වචනය කර ඇත.

''අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යය වනුයේ ඉගෙනීම සඳහා කැමැත්තක් හා පහසුකමක් හට ගැන්වීමය. එමගින් බිහිවිය යුත්තේ ඉගෙනගත් නොව ඉගෙන ගන්නා මිනිසුන්ය. මානව සමාජය යනු ඉගෙන ගන්නා සමාජයකි. එහි සීයලා, ආච්චිලා, මාපියෝ සහ දරුවෝද සාමූහිකව ශිෂ්‍යයෝ වෙති'' (රෝලන්ඩ් අබේපාල, 2019: පිටුව 12).

මේ අනුව පැහැදිලි වන්නේ අධ්‍යාපනය යනු හුදෙක් පාසලේ සිට ගුරුවරයා හා ශිෂ්‍යයා අතර සිදු වන ක්‍රියාවලියක් පමණක් නොව යාවජීව ක්‍රියාවලියක් බවයි. දිවි ඇති තෙක් ලබන්නා වූ සියලුම ආකාරයේ අත්දැකීම් මෙම අධ්‍යාපන සංකල්පයට අයත් වේ. ඒ අනුව අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍ර වන විධිමත් අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය හා අවිධිමත් අධ්‍යාපනය යන මෙම වර්ග 3 යටතේම ශිෂ්‍යයා අධ්‍යාපනය ලබයි. ඒ සඳහා එක් ස්ථානයක් හෝ වයස් සීමාවක් නොමැති බව පැහැදිලි වේ.

උක්ත කරුණු අනුසාරයෙන් පැහැදිලි වන පරිදි අධ්‍යාපනය යනු කායික, මානසික, චිත්තවේගීය හා සමාජයීය සංවර්ධනය සිදු කිරීම සඳහා දැනුම, කුසලතා හා ආකල්පමය වශයෙන් සිදු වන යාවජීව ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියේ සාර්ථකත්වය පවතිනුයේ දර්ශනයේ මග පෙන්වීමෙනි. නැතහොත් හුදෙක් අධ්‍යාපනය ඉබාගාතේ යාමකි.

**දර්ශනය නිර්වචනය කිරීම**

දර්ශනය යන පදයේ සරල අර්ථය දැකීම යන්නයි. නමුත් එය හුදෙක් සරළ දැකීමක් නොව යම් කාරණයක් පැහැදිලි කර ගැනීමේ විවේචනාත්මක හා විශ්ලේෂණාත්මක ක්‍රියාවලියක් බව ඕ. කෝනාර් දක්වයි (එච්.එම්. චන්ද්‍රසේකර, 2018ඃ පිටුව 11). ඒ අනුව දර්ශනය යන වචනය තුළින් සරල අදහසක් ලෙස යම් කිසි දෙයක් පිළිබඳ 'ගැඹුරින් විමසා බැලීම' යනාර්ථය දැක්විය හැකිය.

දර්ශනය යන්න සඳහා ඉංග්‍රිසි බසින් "philosophy" යනුවෙන් භාවිත වන අතර එය ග්‍රීක ශිෂ්ටාචාරයෙන් බිඳී ආවක් බව ටැනේජා දක්වයි (Taneja, 1981: පිටුව 47). එහි අර්ථ විග්‍රහයක යෙදෙන අගාර්වල් හා සීතාරාමු දක්වන්නේ 'phileo' සහ 'Sophia' යන පද ද්වය එකතු වීමෙන් චයසකදිදචයහ යන්න සැකසී ඇති බවයි. එහි 'phileo' යනු 'ආදරය' (love) අර්ථ ඇත්තක් වන අතර 'Sophia' යනු 'ප්‍රඥාව' (Wisdom) යන අර්ථ ඇති පදයකි. ඒ අනුව Philophy යන්නෙහි අර්ථය වනුයේ ප්‍රඥාවට ඇති ආදරය හෙවත් ඇල්මයි (සේනාධීර හා වනසිංහ, 2006ඃ පිටුව 2). ප්‍රඥාව යනුවෙන් අරුත් ගැන්වෙන්නේ සත්‍ය දැකීමේ ඥාණයයි. ඒ අනුව දර්ශනය යනු සත්‍ය සෙවීමෙහි නියුක්ත වූවක් බව පැහැදිලි වේ.

දර්ශනය පිළිබඳ නිර්වචනානුසාරයෙන් ද අර්ථ විග්‍රහ කළ හැකිය. ඒ අනුව Oxford Advanced Learner's Dictionary පහත ආකාරයෙන් දර්ශනය විග්‍රහ කරයි.

''දර්ශනය යනු විශ්වය හා මානව ජීවිතවල ස්වභාවය හා අර්ථය තේරුම් ගැනීමය'' (එච්.එම්. චන්ද්‍රසේකර, 2018ඃ පිටුව 10).

මෙයින් පැහැදිලි වන්නේ දර්ශනය යනු මානවයාගේ ජීවන පැවැත්ම උදෙසා ඇති වන ගැටලු හා මානසිකව ඇති වන ගැටලුකාරී අවස්ථා පිළිබඳ විමර්ශනයෙන් ඒවා තේරුම් කිරීමට උත්සාහ කිරීමක්ය.

මේ අනුව දර්ශනය යනු ස්වභාව සෞන්දර්යට අයත් ගැටලුකාරි අවස්ථා හා සිද්ධි පිළිබඳ මානසිකව විග්‍රහ කිරීම, විශ්ලේෂණය කිරීම, විවේචනය කිරීම ආදි වශයෙන් සිදු වන මානසික ගැඹුරු විග්‍රහය

දර්ශනය බවයි. එය හුදෙක් මිනිසා දකින දැක්ම නොව ඉන් එහා ගිය විශ්ලේෂණීය චින්තනයකි. එය පහත දැක්වෙන ප්‍රකාශයෙන් ද පැහැදිලි වේ.

''අප දකින අත්දකින වස්තූන් ඒ ආකාරයටම පවතින බව පිළිගැනීම සත්වාදය ලෙස සැලකේ. නමුත් මූලික තර්කය වන්නේ අප දකින දේ එලෙසම පවතීද යන්නයි. දර්ශනයේ මූලික ස්වභාවය අප දකින ලොව එලෙසම පවතීද යන ගැටලුව මුල් කොටගත් කුතුහලයයි. මේ තුළින් සිතීම, විමසීම, ප්‍රඥාව, ඥානය, නිදහස, සත්‍ය, යථාර්ථය ආදි සංකල්ප පිළිබඳ විමසා බැලීම දර්ශනයේ තවත් කාර්යයකි'' (එදිරිසිංහ හා පෙරේරා, 2001: පිටුව 9).

මේ අනුව ද පැහැදිලි වන්නේ ලොව විශ්මිත නිර්මාණය වූ මිනිසා ඉතාමත් සංකීර්ණ ජීවිකාවක් ගත කරයි. එමෙන්ම නොපෙනෙන අනාගතයක් සඳහා මුහුණ දිය යුතු ආකාරය මෙන්ම වර්තමානයේ පවතින ගැටලු විසඳා ගැනීම, ස්වභාවික පරිසරයේ ඇති කුතුහල ජනක සිද්ධීන් පිළිබඳව ආදි විවිධ ගැටලු රාශියකට මැදි වී සංකීර්ණ ජීවිතයක් මානවයා ගත කරයි. එම සංකීර්ණත්වය මග හරවා ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම, පිළිතුරු සෙවීම, උපදේශනය සිදු කරනුයේ දර්ශනයයි. අතීතයේ සිටම මිනිසා විමසන ප්‍රශ්න රාශියකි. නොපෙනෙන අනාගතය දක්වාත් විමසන ප්‍රශ්න රාශියකි. ''මිනිසාගේ සම්භවය කෙසේ සිදු වීද? මිනිසා අදිස් බලවේගයක් විසින් මවන ලද්දක්ද? ... මිනිසා ශ්‍රේෂ්ඨත්වයට පත් කිරීම සඳහා උචිත ජීවන පරමාර්ථ කවරේද?... මිනිසා කෙසේ සංවිධානය විය යුතුද? මිනිස් සමාජය කෙබඳු ආකාරයකින් සකස් විය යුතුද? කෙබඳු පරමාර්ථ හා අරමුණු පාදක කොට යහපත් පුරවැසියන් බිහි කළ හැකිද? දැනීම යනු කුමක්ද? විශ්වාසය හා දැනීම අතර පවතින නිශ්චිත වෙනස කෙබඳුද?... යහපත හා අයහපත පිළිබඳ ප්‍රභේදය දත හැක්කේ කෙසේද?'' (වීරසිංහ, 1993: පිටුව 5, 6). ආදි වශයෙන් නානා විධ ප්‍රශ්න මතු කරමින් කුතුහලයෙන් පිරි මිනිසාගේ ගැටලු නිරාකරණයට උත්සුක වනුයේ දර්ශනයයි.

මෙලෙසින් දර්ශනය යනු පුද්ගලයාගේ පවතින ගැටලුකාරී අවස්ථාවන් විමර්ශනය කරමින් ඒවා මග හරවා ගැනීම සඳහා නිවැරදි

මග පෙන්වීමක් සිදු කිරීමයි. එය පුද්ගලයාට පමණක් සීමා වූවක් නොව අධ්‍යාපනය තුළ පවතින ගැටලු මග හරවා ගැනීම උදෙසා ද මග පෙන්වයි.

**අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධය**

අධ්‍යාපනය හා දර්ශනය යනු ඉතා සමීප අන්‍යෝන්‍ය සම්බන්ධයකින් යුක්ත වූ ඒකක ද්වයකි. අධ්‍යාපනයට දර්ශනයත් දර්ශනයට අධ්‍යාපනයත් අත්‍යාවශ්‍යය. එයට හේතු සාධක රාශියකි. අධ්‍යාපනය යනු හුදෙක් ගලා නොබස්නා ජලාශයක් සේ එකතැන පල් වන ගතානුගතික ක්‍රියාවලියක් නොවේ. එය නිතර වෙනස්වන ස්වභාවයෙන් යුක්ත වූවකි. සංස්කෘතික, ආර්ථික, දේශපාලනික හා සාමාජික සාධක හා නිරන්තරයෙන් ගැටෙමින් අලුත් දැනීම් සම්භාරයක්, අලුත් චින්තන විලාශ, අලුත් සමාජ රටා, අලුත් ජීවන දර්ශන, අලුත් සමාජ සම්බන්ධතා මිනිස් චින්තනයේ ප්‍රමාණයට හා භාවිතයට සාපේක්ෂව නිරන්තරයෙන් ගොඩ නැගේ (වීරසිංහ, 1993ඃ පිටුව 10).

මේ නිසාම නිතරම වෙනස්වීම්වලට ලක්වන අනාගතය සඳහා මිනිසුන් සකස් කරන ස්ථානය අධ්‍යාපනයයි. එලෙස වෙනස් වන ජීවන රාටාවට අනුකූලව අවශ්‍ය න්‍යායාත්මක දැනුම ලබා දෙනුයේ දර්ශනය තුළිනි. එම න්‍යායාත්මක දැනුම් සම්භාරයට අනුකූලව මිනිසා පුහුණු කරමින් ජීවිතය සඳහා යොමු කරන්නේ අධ්‍යාපනයයි. එලෙස අධ්‍යාපනයට දර්ශනයක් නොමැති වූයේ නම් ගලා නොබසින ජලාශයක් මෙන් අධ්‍යාපනය ද එකතැන පල් වේ. එම නිසා අධ්‍යාපනයට දර්ශනය ඉතා සමීප සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි වේ.

අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධය මනාව පැහැදිලි වන තවත් අවස්ථාවක් ලෙස, අධ්‍යාපන න්‍යායේ ආරම්භය දාර්ශනික චින්තනයේ ඵලයක් වීම දැක්විය හැකිය (වීරසිංහ, 1993ඃ පිටුව 11). මිනිසාට සහජයෙන්ම උරුම වූ තර්කානුකූලව සිතීමේ ස්වභාවය නිසාවෙන් විවිධ සංස්කෘතික උරුමයන් පාරම්පරිකව ලබා දෙමින් එය පවත්වා ගෙන ඒමට හැකියාව ලැබී ඇත. එම චින්තනයේ අඛණ්ඩව යෙදීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාථමික දඩයම් යුගයේ

සිට ක්‍රමානුකූලව වර්තමානයේ තාක්ෂණික දියුණුව කරා ළඟා වීම අධ්‍යාපනික වශයෙන් සිදු වූ සුවිශාල ජයග්‍රහණයකි. එලෙස එම සොයා ගන්නා වූ සියලු නව දැනුම් සම්භාරය අනෙක් පරම්පාරවට සම්ප්‍රේෂණය කිරීම සඳහා යොදා ගන්නා ලද ක්‍රමය ලෙස අධ්‍යාපනය සැලකිය හැකිය. එයද දර්ශනයේ නිපැයුමකි. 'අධ්‍යාපනය යනු එක් පරම්පරාවක්, එම පරම්පරාවට පසුව එන පරම්පරාවට හිමි කරන සංස්කෘතිකමය දායාදයක්ය' (සේනාධීර හා වනසිංහ, 2006: පිටුව 6) යන 'රෝස්ගේ' ප්‍රකාශයෙන් ද එය පැහැදිලි වේ. එලෙසම අධ්‍යාපනයේ ඇති සෑම සංකල්පයක්ම, ව්‍යවහාරයක්ම යම්කිසි දර්ශනයකට අනුව සැකසී ඇත. එලෙස දර්ශනය සම්බන්ධ නොවූයේ නම් අතීතය හා වර්තමානය අතර කිසිදු වෙනසක් නොපවතිනු ඇත. ඒ අනුව අධ්‍යාපනය දර්ශනයේ නිපැයුමක් වන නිසාවෙන් හා එහි ඇතුළත් සියලු සංකල්ප දර්ශනය මත පදනම් වී ඇති නිසා අධ්‍යාපනය හා දර්ශනය අතර සමීප සම්බන්ධයක් පවතින බව දැක්විය හැකිය.

තවද ක්‍රමානුකූලව සමාජ අවශ්‍යතා පදනම් කර ගනිමින් ඒවාට මුහුණ දිය හැකි පුද්ගලයෙකු බිහි කිරීමට අවශ්‍ය න්‍යායාත්මක දැනුම දර්ශනයෙන් අධ්‍යාපනයට ලබා දේ. එය අධ්‍යාපනය තුළින් ක්‍රියාත්මක කොට සමාජයට මුහුණ දිය හැකි පුද්ගලයකු බිහි කරයි. නොපෙනෙන අනාගතයක් සඳහා පුද්ගලයාට මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම මෙයින් සිදු කරනු ලැබේ. එසේ නොවන්නට දර්ශනය තුළින් සොයා ගන්නා වූ නව න්‍යායන් ද අර්ථ විරහිත උපයෝගීතාවයෙන් තොර වූවක් වනු නිසැකය. ඒ එම න්‍යායන් භාවිතයට ගැනීම සඳහා පුහුණු කිරීමේ ස්ථානයක් නොමැති නිසාය. එම නිසා දර්ශනයේ ක්‍රියාකාරී අංශය අධ්‍යාපනය වීම ද (සේනාධීර හා වනසිංහ, 2006: පිටුව 11), අධ්‍යාපනය හා දර්ශනය අතර සමීප සම්බන්ධතාවයක් පවතින බවට සාධකයකි.

## අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධය නිර්වචනාශ්‍රයෙන්

අධ්‍යාපනය හා දර්ශනය අතර පවතින සම්බන්ධය නිර්වචන ආශ්‍රයෙන් ද පැහැදිලි කරගත හැකිය. ඒ අනුව පීටර්ස් දක්වන ''අවදි බවෙන් හා විචාරශීලී මනසකින් යුක්තවූවන් බිහි කිරීම අධ්‍යාපනයේ වැදගත් පරමාර්ථයකි.'' යන ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ පුද්ගලයා

තුළ විවේචනාත්මක, විචාරශීලි බව ඇති කිරීමට නම් අධ්‍යාපනය දාර්ශනික මතයන්වලට අනුව සකස් කළ යුතුය. නැතහොත් එය හුදෙක් අර්ථ ශූන්‍ය ක්‍රියාවලියක් පමණක්ම වේ.

අධ්‍යාපනය හා දර්ශනයේ සමීපතාවය අගාර්වල් මෙසේ දක්වයි. ''දර්ශනය නොමැති අධ්‍යාපනය අන්ධ පරිශ්‍රමයක් බවත්, අධ්‍යාපනය නොමැති දර්ශනය අබ්බගාතයෙක් වැනි'' (Aggarwal, 2000: පිටුව 45) යනුවෙනි. එහි දැක්වෙන පරිදි දර්ශනයකින් තොර වූ අධ්‍යාපනය හුදෙක් අන්ධයන් වෙසෙන ස්ථානයක් හා සමානය. ඔවුන් කිසිවෙක් ඉන්නෙ කොතැනද? කවුද ඉන්නේ? කෙසේ කටයුතු සිදු වන්නේද? ආරක්ෂිතද? අනාරක්ෂිතද? අනාගත අභිප්‍රායන් ආදි කිසිවක් පිළිබඳ දැනීමක් නොමැත. ඒ ඔවුන්ගේ දෑස් නොමැති නිසාය. මෙම සියලු ලක්ෂණ දර්ශනයකින් තොර වූ අධ්‍යාපනයක ද දැකිය හැකිය. ඒ අනුව අප ඉගෙන ගන්නේ ඇයි? ඉගෙන ගන්නා දෙයෙහි උපයෝගීතාවයක් තිබේද? යා යුතු මාර්ගය කුමක්ද? අධ්‍යාපනයේ අනාගත සූචක වලංගුතාවය කවරේද? ආදි වූ ගැටලු රාශියකට මැදි වන අතර ඒවාට ලැබෙන පිළිතුරු ද නිශේධනාත්මක ඒවා බව පැහැදිලි වේ. එම නිසා අධ්‍යාපනයට දර්ශනය අනිවාර්ය වේ.

එලෙසම උක්ත අගාර්වල්ගේ ප්‍රකාශයේ සඳහන් 'අධ්‍යාපනය නොමැති දර්ශනය අබ්බගාතයෙක් වැනිය' යන ප්‍රකාශයෙන් ද පැහැදිලි වන්නේ දර්ශනයට අධ්‍යාපනයේ අවශ්‍යතාවයයි. දර්ශනය තුළින් මූලික න්‍යායන් ගොඩ නගන අතර එය ක්‍රියාත්මක කිරීම අධ්‍යාපනයෙන් සිදු කරයි. එසේ ක්‍රියාත්මක කිරීමක් සිදු නොවූ විට එම දර්ශනය උපයෝගීතාවයෙන් තොරය. එලෙසම උපයෝගිතාවයෙන් අධ්‍යාපනය තොර වුවහොත් මානවයාගේ පැවැත්ම ද අවිනිශ්චිතය. සියල්ලගේ පැවැත්ම උපයෝගිතාවය මත තීරණය වේ. එලෙසින් උපයෝගිතාවය මත දර්ශනය ගොඩ නගන අතර, දර්ශනයේ උපයෝගීතාවයෙන් අධ්‍යාපනයත් ඒ මත පුද්ගල හෝ සමාජ පැවැත්මත් තීරණය වේ. ඒ අනුව දර්ශනට ද අධ්‍යාපනය අවශ්‍යය. නැතාහොත් එහි උපයෝගීතාවයක් නොමැත. න්‍යායාත්මත ස්වරූපයක් පමණක් ශේෂ වේ.


අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධය දක්වන තවත් නිර්වචනයක් ලෙස 'අධ්‍යාපන සැලැස්මක් පිළියෙල කිරීමේ දී ත් එය ක්‍රියාත්මක කිරීමේදීත් දර්ශනයක් නොමැතිව එය සිදු නොවේ' (රුබේරු, 1997: පිටුව 11) යන්න දැක්විය හැකිය. එයින් ද පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනයේ ඇති සම්බන්ධතාවයයි. එලෙසම ජේ.එස්. බෲබකර් දක්වන ආකාරයට 'අධ්‍යාපනය යනු යම් පිළිගත් දර්ශනයක් ක්‍රියාවට නැඟීමය' (විමලධම්ම හිමි, 2016, පිටුව 106). යන මෙයින්ද අධ්‍යාපනය හා දර්ශනය අතර සමීප සම්බන්ධතාවයක් පවතින බව මනාව පැහැදිලි වේ. එලෙසම 'Education is blind without PhilÈophy' යන ප්‍රකාශයෙන් ද දැක්වෙන පරිදි දර්ශනයෙන් තොර අධ්‍යාපනය අන්ධය. එවැනි අධ්‍යාපනයක් අන්ධයකු විසින් සිදු කරන ක්‍රියාවන් හා සමාන වේ. මෙවැනි ප්‍රකාශවලින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති අවියෝජනීය සම්බන්ධතාවයයි.

මීට අමතරව 'අධ්‍යාපනය හා දර්ශනය යනු එකම කාසියක දෙපැත්තකි' යනුවෙන් අධ්‍යාපනයට දර්ශනයත්, දර්ශනයට අධ්‍යාපනයත් වශයෙන් ඉතා සමීප සම්බන්ධතාවක් පවතින බව පැහැදිලි වේ. අනාගත සමාජ උපයෝගිතාවයට අනුව පුද්ගලයා හැඩගැස්විය යුතුය. ඒ සඳහා සකස් කළ යුතු වන්නේ කවරාකාර පුද්ගලයෙක් ද යන්න හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය මූලධර්ම, න්‍යායන්, සිද්ධාන්ත සකස් කිරීම දර්ශනයෙන් සිදු වේ. ඒවා ක්‍රියාත්මක කිරීම අධ්‍යාපනයෙන් සිදු වේ. ඒ අනුව අධ්‍යාපනයට දර්ශනයත් දර්ශනයට අධ්‍යාපනයත් එක සේ වැදගත් වන බව එනම් එකම කාසියක දෙපැත්තකට සමාන වන පැහැදිලි වේ.

මීට අමතරව ටැනේජාගේ 'අධ්‍යාපන ක්‍රියාවලියේ දී අරමුණු, විෂයමාලාව, පාඨග්‍රන්ථ, විෂයයන්, ගුරුවරුන් ආදි විවිධ ක්ෂේත්‍ර සඳහා දර්ශනය උපකාරී වේ' (සේනාධීර හා වනසිංහ, 2006, පිටුව 12). යන ප්‍රකාශයට අනුව අධ්‍යාපන ක්‍රියාවලියේදී හඳුනාගත හැකි මූලික විචල්‍යයන්ට අදාළව දර්ශනය සම්බන්ධ වන ආකාරය විමසිය හැකිය.

**ගුරුවරයා හා දර්ශනය සම්බන්ධ වන ආකාරය**

අධ්‍යාපන ක්‍රියාවලියේ දී හමුවන ප්‍රධාන විචල්‍යයන් 3කි. එය පහත රූප සටහනෙන් පැහැදිලි වේ.




රූප සටහන 1

මෙම රූප සටහනට (අතුකෝරාළ හා අතුකෝරාල, 2015, පිටුව 52) අනුව අධ්‍යාපනයේ ප්‍රධාන විචල්‍යයක් ලෙස ගුරුවරයා දැක්විය හැකි අතර ගුරුවරයාට දර්ශනය සම්බන්ධ වන ආකාරය විමසීමෙන් අධ්‍යාපනයට දර්ශනය සම්බන්ධ වන ආකාරය හඳුනාගත හැකිය.

ෆිච්ටේ විසින් ගුරුවරායට දර්ශනය උපයෝගී වන අවස්ථා 4ක් දක්වයි.

I. නානා ප්‍රකාර පසුබිම් සහ පෞරුෂත්වවලින් යුක්ත දරුවන්ට උදව් කිරීම,

II. එවැනි දරුවන්ට අදාල විෂය සන්ධාරය සහ ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීම,

III. දරුවන්ට අවශ්‍ය හැසිරීම් සඳහා කුමන කරුණු අඩංගු කළ යුතුද යන්න දැන ගැනීම,

IV. අධ්‍යාපනික අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා ප්‍රයත්න දැරීම (අතුකෝරාළ හා අතුකෝරාල, 2015: පිටුව 12).

ආදි වශයෙන් ගුරුවරයාට දර්ශනයේ උපයෝගීතාවය හා දර්ශනය සම්බන්ධ වන ආකාරය පැහැදිලි කළ හැකිය.

මීට අමතරව මූලිකව ගුරුවරයාට තමන්ගේ ඉගැන්වීම් ක්‍රමශිල්ප වර්ධනය කර ගැනීම උදෙසා දර්ශනය උපකාරී වේ. ශිෂ්‍යයන්ට ගැළපෙන ලෙස ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීමට නම් ගුරුවරයාට එම න්‍යායන් පිළිබඳ අවබෝධය අත්‍යාවශ්‍යය. නැතහොත් එම ඉගැන්වීම් ඵලදායී නොවීමට ඇති අවකාශය වැඩිය.

තවද ගුරුවරයාට ශිෂ්‍යයාගේ වයස් මට්ටම්, ශාරීරික වර්ධනය, මානසික මට්ටම ආදිය සලකා බලමින් ඒ සියල්ලන්ට ගැළපෙන ලෙස ඉගැන්වීම් ක්‍රමවේද අනුගමනය කිරීමට උපකාරී වනුයේ දර්ශනයයි.

එලෙසම ගුරුවරයා විචාරවත්ව හා නිර්මාණාත්මකව සිතන්නට, කියන්නට, මඟ පෙන්වන්නට, හැසිරෙන්නට හා සොයන්නට නොමියෙන උත්තේජනයක් ලබා දීමට නම් නිසි දර්ශනයක් අවශ්‍යය. එම නිසා ගුරුවරයා තුළ විචාරශීලි, නිර්මාණාත්මක චින්තනයක් ගොඩ නැංවීමට ගුරුවරයාට දර්ශනය අවශ්‍ය වේ. එම විචාරශීලි චින්තනයෙන් යහපත් විචාරශීලි ශිෂ්‍යයින් පිරිසක් සකස් කර ගැනීමේ අවකාශය ලැබේ.

එලෙසම සමාජ ආර්ථික, දේශපාලනික හා සාමාජික ගැටලු පොකුරු ලිහාලීමට සමාජයට උපකාරවීම සඳහා උසස් දැනුමින්, ගුණවත්කමින් හා කුසලතාවෙන් පිරිපුන් උදාර සිසුන් පිරිසක් බිහි කර ගැනීමට නම් ගුරුවරයාට නිසි දර්ශනයක් අවශ්‍යය (වීරසිංහ, 1993, පිටුව 28, 29). නැතහොත් එය හුදෙක් පංති කාමරයේ සිදු වන යම් තොරතුරු හුවමාරුවකට පමණක් සීමා විය හැකිය. එම නිසාවෙන්ම රොබට් රස්ක් ප්‍රකාශ කරනුයේ සෑම අධ්‍යාපනඥයෙකුම දාර්ශනිකයෙකු විය යුතු බවයි (සේනාධීර හා වනසිංහ, 2006: පිටුව 11). මේ අනුව පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති අවියෝජනීය සම්බන්ධතාවයයි.

**ශිෂ්‍යයා හා දර්ශනය සම්බන්ධ වන ආකාරය**

රූප සටහන 1හි දැක්වෙන ආකාරයට අධ්‍යාපනයේ තවත් ප්‍රධාන විචල්‍යයක් ලෙස ශිෂ්‍යයා දැක්විය හැකිය. ශිෂ්‍යයාට ද දර්ශනය බෙහෙවින් උපකාර වේ. තම දක්ෂතාවන් හඳුනා ගැනීමට, අනාගත අරමුණු හා පරමාර්ථ සකසා ගැනීමට, ඉගෙනුම් ක්‍රමවේද

හැඳින ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ මනාව නියැලීමට නම් දර්ශනයක් මනාව පිහිටා තිබිය යුතුය. නැතහොත් මහ මුහුදේ අතරමං වූ නෞකාවක් හා සමාන විය හැකිය.

එලෙසම අධ්‍යාපනයෙන් ශිෂ්‍යයා ගොඩ නගන්නේ මූලිකව යහපත් සමාජයක් සකස් කරවීමේ අරමුණ ඇතිව පූර්ණ පුද්ගලයෙකු ලෙසය. එලෙස පූර්ණ පුද්ගලයෙක් බිහි වීමට නම් පූර්ණ පුද්ගලයෙක් යනු කවරෙක්ද යන්නත් ශිෂ්‍යයා තුළ එවැනි ගුණාංග සංවර්ධනය වී පවතීද යන්නත් සොයා ගැනීමට නම් පූර්ණ සංවර්ධනයක් සඳහා සංවර්ධනය විය යුතු අංශ පිළිබඳ දැනුමක් අවබෝධයක් තිබිය යුතුය. එලෙසින් විමසීමට දර්ශනය ශිෂ්‍යයාට අනිවාර්ය සාධකයක් බව පැහැදිලි වේ.

තවද ශිෂ්‍යය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් යටතේ අධ්‍යාපනය මෙහෙය වන විට ශිෂ්‍යයාගෙන් ඉටු විය යුතු දෑ පිළිබඳ නිවැරදි අවබෝධයක් ශිෂ්‍යයාට තිබිය යුතුය. ශිෂ්‍යයාට තම දැනීමේ ස්වභාවය, දැනුම ලබා ගැනීමේ මූලාශ්‍ර, විවිධ ක්ෂේත්‍රවල දැනුම් සම්භාරයන්, දැනුම ලබා ගන්නා ක්‍රම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට, නිශ්චිත අන්තර්ගත සකසා ගැනීමට හා නානාවිධ ගැටලු විසඳා ගැනීම සඳහා ද ශිෂ්‍යයාට දර්ශනය අවශ්‍ය වේ. මේ අයුරින් අධ්‍යාපනයේ ප්‍රධාන සාධකයක් ලෙස සැලකෙන, ශිෂ්‍යයාට දර්ශනය සම්බන්ධ වීම හරහා පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සම්බන්ධයයි.

**විෂය මාලාව හා දර්ශනය සම්බන්ධ වන ආකාරය**

විෂය මාලාව ද අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන විචල්‍යයක් බව උක්ත රූප සටහන 1 අනුව පැහැදිලි වේ. විෂය මාලාව සකස්වීමේ පටන්ම දර්ශනය එයට සම්බන්ධ වේ. විෂය මාලාව තුළින් ශිෂ්‍යයාගේ අනාගතය තීරණය වේ. එය නිතරම සමාජයට, රටට, දේශපාලනයට, පරිසරයට අනුකූල විය යුතුය. ඒ සියලු කරුණු දෙස අවධානය යොමු කරමින් නොපෙනෙන අනාගතයක් සඳහා ශිෂ්‍යයා සකස් කිරීම විෂය මාලාව හරහා ක්‍රියාත්මක විය යුතුය. ඒ සියල්ල දෙස අවධානය යොමු කරනවා සේම ශිෂ්‍යයාගේ ස්වභාවය, මානසික මට්ටම, වයස් මට්ටම, බුද්ධිමය වර්ධනය ආදි සියල්ල ගැන සිතීම අනිවාර්ය කරුණකි. එම නිසාවෙන් විෂය මාලාවක් සැකසීමට දර්ශනය අත්‍යාවශ්‍ය සාධකයකි.

එලෙසම විෂය මාලාව පවත්වා ගෙන යාමටත් එය කාලානුරූපිව යාවත්කාලීන වීම සඳහාත් මූලිකව අවශ්‍ය වනුයේ දර්ශනයයි. නියමිත කාලයට අනුව එය මෙහෙයවා ගනිමින් ඉගෙනුම්ඵල සාර්ථකව අත්පත් කර ගැනීමට නම් එය මනාව කළමනාකරණය කළ යුතු වේ. නැතහොත් එහි උපරිම ඵල නෙළා ගැනීමේ අවස්ථාව අහිමි වේ. මේ නිසා විෂය මාලාව සැකසීමේ පටන් එය පවත්වා ගෙන යාමට, එය යාවත්කාලීන කර ගැනීම ආදි බොහෝ අවස්ථාවන්වල දී දර්ශනය අවශ්‍ය වේ. මෙනයින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනය අතර ඇති සම්බන්ධයයි.

**ඇගයීම හා දර්ශනය සම්බන්ධ වන ආකාරය**

අධ්‍යාපන ක්‍රියාවලියේ තවත් ප්‍රධාන සංකල්පයක් ලෙස ඇගයීම දැක්විය හැකිය. ශිෂ්‍යයා විසින් ළඟා වීමට අපේක්ෂිත ඉගෙනුම්ඵල කොතරම් දුරට අත්පත් කරගෙන ඇත්දැයි විමසීම සිදු කරනුයේ ඇගයීම හරහාය. ඒ අනුව ජාතික අධ්‍යාපන අරමුණු ඇතුළු සියලු අරමුණුවලට ගැළපෙන පරිදි ශිෂ්‍යයා සකස් වී ඇත් දැයි මැනීම සඳහා ඇගයීමක් පැවැත්විය යුතුය. එය එක් ක්‍රමවේදයක් තුළින් සිදු කළ හැකි නොවේ. ඒ සඳහා විවිධ ක්‍රමවේද ඒ ඒ විෂය සන්දර්භය අනුව තෝරාගත යුතුය. එවැනි වූ විවිධ ඇගයීම් ක්‍රමවේද සකස් කිරීමද, සන්දර්භයට ගැළපෙන ඇගයීම් ක්‍රමවේදය තෝරා ගැනීම ද සිදු වනුයේ දර්ශනය උපයෝගී කර ගෙනය. මෙලෙසින් ඇගයීම් සංකල්පය සඳහාද දර්ශනය සම්බන්ධ වේ.

**විෂය සමගාමී ක්‍රියාකාරකම් හා දර්ශනය සම්බන්ධ වන ආකාරය**

අධ්‍යාපන පද්ධතිය තුළ විෂය මාලාවක් පැවතිය ද ශිෂ්‍යයාගේ සමස්ථ සංවර්ධනයක් සඳහා එය ප්‍රමාණවත් නොවේ. එම නිසාවෙන් ශිෂ්‍යයා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල මෙන්ම විෂය බාහිර ක්‍රියාකාරකම්වල ද යෙදවිය යුතු වේ. එවැනි ක්‍රියාකාරකම් ශිෂ්‍යයාට ගැළපේද ඒවායේ යෙදවීමෙන් ශිෂ්‍යයාගෙන් අපේක්ෂිත ඵල සංවර්ධනය කළ හැකිද යන්නත් විමසීම හා තීරණය කිරීම සිදු වනුයේ දර්ශනය තුළිනි. ඒ අනුව පැහැදිලි වන්නේ විෂය මාලාවට බාහිරව සිදු වන මෙවැනි ක්‍රියාකාරකම් සඳහා ද දර්ශනය සම්බන්ධ වන බවය.

## අධ්‍යාපන අරමුණු හා පරමාර්ථ, දර්ශනය හා සම්බන්ධ වන ආකාරය

අධ්‍යාපන අරමුණු හා පරමාර්ථ සකසා ගැනීම, පවත්වාගෙන යාම, එය තක්සේරු කිරීම සඳහා සුදුසු ඇගයීම් ක්‍රම සකස් කර ගැනීම ආදිය සඳහා ද දර්ශනය උපකාරී වේ. අධ්‍යාපන අරමුණුවල වැදගත්කම දක්වන ෆිච්ටේ දක්වන්නේ 'අරමුණක් නොමැති අධ්‍යාපන ක්‍රියාවලිය අර්ථ විරහිත බවයි' (සේනාධීර හා වනසිංහ, 2006, පිටුව 12). එනයින් අධ්‍යාපනයට අරමුණු සකස් කර ගැනීම උදෙසා දර්ශනය මූලික කාර්යභාරයක් සපයයි. අධ්‍යාපන අරමුණු ජාතික අධ්‍යාපන අරමුණු, පාසල් අධ්‍යාපන අරමුණු, විෂය අරමුණු ආදි වශයෙන් විවිධ ආකාරයෙන් හඳුනාගත හැකිය. එම අරමුණු ඉටු කර ගැනීමට ශිෂ්‍යයාගේ ස්වභාවය, මානව හා භෞතික සම්පත්වල ප්‍රමාණය හා අරමුණු කරා ළඟා වීමේ හැකියාව ආදිය තීරණය කිරීම සඳහාද දර්ශනය අවශ්‍ය වේ. නැතහොත් එම අරමුණු නාමික අරමුණක් පමණක් වන අතර එයින් ලබා ගත හැකි ප්‍රයෝජන අවම විය හැකිය. එම නිසා අධ්‍යාපනය හා දර්ශනය මනා සබඳතාවකින් යුක්ත බව පැහැදිලි කළ හැකිය.

## කළමනාකරණය හා දර්ශනය සම්බන්ධ වන ආකාරය

අධ්‍යාපන කළමනාකරණ ක්ෂේත්‍රයේ සිටින පුද්ගලයන්ට ද දර්ශනය මූලිකව අවශ්‍ය වේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකරුවෝ විශාලය. අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්, පළාත් අධ්‍යාපන නිලධාරීන්, දිස්ත්‍රික් හා කලාප අධ්‍යාපන නිලධාරීන් මෙන්ම පාසල් කළමනාකරණ නිලධාරීන් ද වශයෙනි. මෙම සියලු කළමනාකරුවන්ට තම භූමිකාව නිවැරදිව කළමනාකරණය කර ගැනීම සඳහා යම් යම් න්‍යායන්, ක්‍රමවේද, අනුගමනය කිරීමට සිදු වේ. ඒ අනුව ඒ සියලු කළමනාකරුවන්ට ද දර්ශනය අවශ්‍ය වන අතර ඒ තුළින්ද පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධයයි.

## පරිපාලනය හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දර්ශනය සම්බන්ධ වන ආකාරය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන තවත් අංශයක් ලෙස පරිපාලනය හා ප්‍රතිපත්ති සම්පාදකයින් දැක්විය හැකිය. ඔවුන් සකස්

කරන ප්‍රතිපත්තීන්වලට අනුකූලව අධ්‍යාපන පද්ධතිය ක්‍රියාත්මක වේ. එම නිසා ඔවුන්ගේ භූමිකාව රටේ අනාගතය, ශිෂ්‍යයාගේ අනාගතය තීරණය කරනු ලැබේ. ඔවුන්ට අනාගතය ගැන දැකීමට නිවැරදි දර්ශනයක් නොමැති නම් අධ්‍යාපන පද්ධතියේ කඩා වැටීමට එය හේතු වේ. අධ්‍යාපන පද්ධතියේ කඩා වැටීම යනු රටේ පසුබෑමයි. එම නිසා හොඳම ආයෝජනය ලෙස සැලකෙන අධ්‍යාපනය සඳහා හොඳ පරිපාලකයින් හා ප්‍රතිපත්ති සම්පාදකයින් සකස් කර ගත යුතුය. රටේ වර්තමාන තත්වය, අනාගතයේ මුහුණ දීමට සිදු වෙතැයි අපේක්ෂා කරන තත්වයන්ට සුදුසු ශිෂ්‍යයන් බිහි කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිවැරදි දර්ශනයක් උපයෝගී කරගත යුතුය. ඒ අනුව අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධය තවදුරටත් තහවුරු වේ.

මේ ආදි වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින සියලුම විචල්‍යයන් හා සංකල්පවලට දර්ශනය මනාව උපයෝගී වේ. එයින් ඉතා සමීප සම්බන්ධයක් අධ්‍යාපනය හා දර්ශනය අතර පවතින බව පැහැදිලි වේ.

මීට අමතරව අධ්‍යාපනයට දර්ශනය සම්බන්ධ වන ආකාරය සමස්ථයක් ලෙස පහත සඳහන් කරුණුවලින් ද අනාවරණය වේ.

- 'මිනිසාගේ ජීවිතය, ඔහුගේ ක්‍රියාකාරීත්වය, අදහස් හා ගැටළු හඳුනා ගැනීමට,
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය විශ්වාසය, අගයයන්, උපකල්පන හා විනිශ්චයන් ලබා ගැනීමට,
- සුදුසු අධ්‍යාපන ක්‍රියාවලියක් තීරණය කිරීමේ දී චරිත ලක්ෂණ හා විෂයානුබද්ධ කරුණු හා කුසලතා, අපේක්ෂිත අරමුණු ආදිය සලකා බැලීමට,
- පුද්ගලයාගේ, ඔහුගේ පවුලේ, සමාජයේ හා රටේ අපේක්ෂණ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට,
- ජීවිතයේ විවිධාකාරී ඉල්ලුම් හා නිවැරදි චින්තනය සඳහා අවශ්‍ය අත්දැකීම් ඉදිරිපත් කිරීමට,

- පුද්ගලයාගේ ජීවිතය නිශ්ඵල නොවී සාර්ථක කර ගැනීමට අවශ්‍ය තාර්කික ශක්තිය ලබා දීමට,
- පුද්ගලයා තුළ භක්තිය හා විශ්වාසය ඇති කිරීමට' (සේනාධීර හා වනසිංහ, 2006: පිටුව 11),
- 'පොදු අධ්‍යාපන පරමාර්ථ හඳුනා ගැනීමට පරිචයක් ලබා ගැනීමට,
- තමා උගන්වන විෂයන් මැනවින් ඉගැන්වීම සඳහා උචිත අධ්‍යාපන පරමාර්ථ හඳුනා ගැනීම සඳහා පුහුණුවක් ලබා ගැනීමට,
- මානව හිතවාදීව තම කාර්යභාරය ඉටු කිරීම සඳහා උචිත ආකල්ප සම්පත්තියක් දියුණු කර ගැනීමට,
- ප්‍රවීණ සන්නිවේදන කුසලතාව හඳුනා ගැනීම හා භාවිත කිරීමට,
- කරුණු විස්තර කිරීමේ දී භාෂාව නිවැරදිවත් ව්‍යක්තවත් අර්ථ සම්පන්නවත් පරිහරණය කිරීමට පුහුණුවක් ලබා ගැනීමට,
- උචිත අයුරු ප්‍රශ්න කිරීමටත් ඒ අනුසාරයෙන් ශිෂ්‍යයා දන්නා දෙයින් නොදන්නා දෙයට අනුපිළිවෙලින් පිහිටුවීම සඳහා කුසලතාව ලබා ගැනීමට,
- ක්‍රමානුකූල බව, නිවැරදි බව, ශාස්ත්‍රීය බව, නිර්මාණාත්මක බව, ස්වාධීන බව වැනි මානසික කුසලතා දියුණු කරමින් අදීන, නිවහල්, නිදහස් පුරවැසියන් බිහි කරවීම සඳහා පුරෝගාමියකු වීමට' (වීරසිංහ, 1993: පිටුව 31 - 33).

ආදි වශයෙන් අධ්‍යාපනය හා දර්ශනය අතර මනා සබඳතාවක් පවතින බවත් ඒවා එකිනෙක වෙන් කළ නොහැකි අවියෝජනීය සම්බන්ධයකින් සමන්විත බවත් මෙම කරුණුවලින් පැහැදිලි වේ.

## සමාලෝචනය

උක්ත කරුණුවලට සමගාමීව පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා දර්ශනය ඉතා සමීප සම්බන්ධතාවකින් සමන්විත බවයි. ඒ අනුව මූලිකව අධ්‍යාපන න්‍යාය සැකසීමට ද මූලික පසුබිම සැකසී ඇත්තේ දර්ශනයෙනි. අධ්‍යාපන අරමුණු සකස් කිරීමට, අධ්‍යාපනයෙන් සමාජය හා රට අපේක්ෂා කරන දේ එලෙසින්ම ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රමවේද ඉදිරිපත් කිරීමට, ගුරුවරයාගේ ගුරු භූමිකාව නිවැරදිව සිදු කර ගැනීමට, ශිෂ්‍යයාගේ ඉගෙනුම් ක්‍රමවේද ක්‍රමානුකූලව සාර්ථකව සිදු කර ගැනීමට, විෂය මාලාව සැකසීමේ පටන් එය පවත්වා ගෙන යාම හා යාවත්කාලීන කිරීම ආදිය සඳහා, අධ්‍යාපන ඇගයීම් ක්‍රම නිවැරදිව සකස් කර ගැනීමට හා නිවැරදිව ක්‍රියාත්මක කර ගැනීමට, අධ්‍යාපන කළමනාකරුවන්ට ඔවුන්ගේ භූමිකාව නිවැරදිව සිදු කර ගැනීමට, පරිපාලකයන්ට හා ප්‍රතිපත්ති සම්පාදකයන්ට එය නිවැරදිව සිදු කර ගැනීම ආදි විවිධ අධ්‍යාපන අවස්ථාවලට දර්ශනය සම්බන්ධ වන බව පැහැදිලි වේ.

මේ අයුරින් දර්ශනය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සෑම කාර්යයක්, සෑම සංකල්පයක්, සෑම විචල්‍යයක් සඳහාම සම්බන්ධ වන සුවිශේෂී වූ චින්තාවලියක් බව පැහැදිලි වන අතර එයින් අධ්‍යාපනය හා දර්ශනය යනු එකම කාසියක දෙපැත්තක් හා සමානව අවයෝජනීය සම්බන්ධයකින් යුක්ත වූවක් බවද තහවුරු කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


1. අතුකෝරාළ, දයා රෝහණ හා අතුකෝරාල, හේළි නිමාල (2015). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා*. ශික්ෂා මන්දිර ප්‍රකාශන, පානදුර.
2. අබේපාල, රෝලන්ඩ් (2019). *අධ්‍යාපන දර්ශනයේ පෙරදිග පැතිකඩ*. සාර ප්‍රකාශන, කොට්ටාව.
3. අලුත්වල, සුමනරත්න (1993). *බෞද්ධ සාහිත්‍යයෙන් මතු වන අධ්‍යාපන මූලධර්ම*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
4. එදිරිසිංහ, දයා හා පෙරේරා, ගුණදාස. (2001). *දාර්ශනික විමර්ශන*. වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල.
5. කලන්සූරිය, ඒ.ඩී.වී. (2002). *දර්ශනයඃ හැඳින්වීමක්*. ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

6. චන්ද්‍රසේකර, එච්.එම්. (2018). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම.* සාර ප්‍රකාශන, කොට්ටාව.

7. රුබේරු, රංජිත් (1997). *නව අධ්‍යාපන සංකල්ප.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

8. විමලධම්ම හිමි, අම්පේ (2006). *සදානන්ද ශාස්ත්‍රීය සංග්‍රහය.* පල්ලේගම සාරධ හිමි හා ඩබ්ලිව්.ආර්. රත්නායක (සංස්.), ''අධ්‍යාපනය හා දර්ශනය අතර සම්බන්ධතාවය පිළිබඳ විමසීමක්''. ශ්‍රී සදානන්ද පිරිවෙන, දොරණෑගොඩ.

9. වීරසිංහ, හෙන්රි (1993). *අධ්‍යාපන දාර්ශනික ගැටළු.* කර්තෘ ප්‍රකාශන.

10. වීරසිංහ, හෙන්රි (1993). *අධ්‍යාපන දර්ශන ප්‍රවේශය.* නිපුණ එන්ටප්‍රයිසස්, නුගේගොඩ.

11. සේනාධීර, සිල්වි හා වනසිංහ, ශාමින්ද (2006). *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සැලසුම්කරණය සඳහා දාර්ශනික මාර්ගෝපදේශ.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

12. Aggarwal, J.C. (1995). *Teacher and education in a developing society*. Vikas Publication House, New Delhi.

13. Aggarwal, J.C. (2000). *Theory and principles of education philosophical and sociological bases of education*. Vikas Publication House, New Delhi.

14. Taneja, V.R. (1981). *Educational thought and practice*. Sterling Publishers, New Delhi.

15. Willians, Monier (1960). *Sanskrit-English Dictionary*. Oxford University